ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

කාලය පැය එකයි.

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය I | කාලය පැය 01 යි |
|---|---|---|

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

---

01. මාළිගාවෙන් පිටත ලෝකයේ යථාර්ථය දැකීමේ අදහසින් රාජ උයනට යන සිද්ධාර්ථ කුමරුන්ට මග දී සතර පෙර නිමිති දක්නට ලැබුණි. ඒවා පිළිවෙලින්,
    1. ලෙඩෙක්, මහල්ලෙක්, මළ කඳක්, පැවිදි රුවක් ය.
    2. මහල්ලෙක්,ලෙඩෙක්, මළ කඳක්, පැවිදි රුවක් ය.
    3. මළ කඳක්, ලෙඩෙක්, මහල්ලෙක්, පැවිදි රුවක් ය.
    4. පැවිදි රුවක්, මහල්ලෙක්, මළ කඳක්, ලෙඩෙක් ය.

02. සිදුහත් බෝසතුන්ගේ ශාන්ත බව හා රූපශ්‍රීය දැක "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති" යනාදි වශයෙන් කරන ලද ප්‍රකාශයන් හැඳින්වෙන්නේ,
    1. ථෙරී ගාථා නමින් ය.
    2. නරසීහ ගාථා නමින් ය.
    3. නිබ්බුත පද නමින් ය.
    4. උදාන නමින් ය.

03. සිද්ධාර්ථ කුමාර අවධිය අභියෝග වලින් පිරුණකි. සිදුහත් බෝසත් කුමරුට මුහුණ දීමට සිදු වූ අභියෝගයක් නොවන්නේ,
    1. පස්කම් සුව අත්හැරීම.
    2. තනතුරු පිරිනැමීම.
    3. සතර පෙර නිමිති දැකීම.
    4. ශිල්ප හැදෑරීම.

04. "බුදු ගුණ අනන්තය" ඒ බුදුගුණ අතරින් ආලවක කුමාරයාටත්, අංගුලිමාලටත් පිහිට වීමෙන් පිළිබිඹු වන බුදු ගුණ වන්නේ,
    1. අසරණ සරණ ගුණය හා පුරිසදම්ම සාරථී ගුණය.
    2. පුරිසදම්ම සාරථී ගුණය හා අසරණ සරණ ගුණය.
    3. තාදි ගුණය හා පුරිසදම්ම සාරථී ගුණය.
    4. ගිලනුන්ට උපස්ථාන කිරීම හා පුරිසදම්ම සාරථී ගුණය.

05. සුන්දර වූ ගමන් ඇති හෙයින් ද, යහපත් වචන පවසන හෙයින් ද, සුන්දර වූ නිවනට පැමිණි හෙයින් ද බුදුරජාණන් වහන්සේ,
    1. භගවා නම් වන සේක.
    2. ලෝකවිදූ නම් වන සේක.
    3. අරහං නම් වන සේක.
    4. සුගත නම් වන සේක.

06. අප මහා බෝසතාණන් වහන්සේ "සත්‍ය පාරමිතාව" පිරූ ආකාරය හෙළි වන ජාතක කතාව වන්නේ,
    1. තේමිය ජාතකයයි.
    2. ලෝමහංස ජාතකයයි.
    3. මහා කපි ජාතකයයි.
    4. වට්ටක ජාතකයයි.

07. බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මය අන්තර්ගත කොට පස්වග තවුසන් අමතා දේශනා කළේ,
    1. අනන්ත ලක්ඛණ සූත්‍රය යි.
    2. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.
    3. දම්සක් පැවතුම් සූත්‍රය යි.
    4. පරාභව සූත්‍රය යි.

08. තණ්හාවෙන්, මානයෙන් හා මිත්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් පිරිය යුතු ගුණ ධර්ම වන්නේ,
    1. පාරමිතාවන් ය.
    2. සමාධිය යි.
    3. සීලය යි.
    4. භාවනාව යි.

www.edudept.up.gov.lk

09. ගැබිනි මාතාවන්ගේ දරු ප්‍රසූතිය පහසු කිරීම උදෙසා භික්ෂූන් වහන්සේලා දේශනා කරනු ලබන පිරිත වන්නේ,
   1. ජය පිරිත යි.
   2. අංගුලිමාල පිරිත යි.
   3. වැසි පිරිත යි.
   4. ධජග්ග පිරිත යි.

10. බුද්ධා දී ත්‍රිවිධ රත්නයෙහි ගුණ අවබෝධ කොටගෙන ඇතිවන ප්‍රසාදය හෙවත් පැහැදීම බුදුදහමේ හැඳින්වෙන්නේ,
   1. බුද්ධාලම්බනය නමිනි.
   2. අමූලික ශ්‍රද්ධාව නමිනි.
   3. ආකාරවතී ශ්‍රද්ධාව නමිනි.
   4. ආගමික භක්තිය නමිනි.

11. යමක් කිරීමෙන් පසු පසු තැවෙන්නට සිදු වන ක්‍රියා නොකරන්නට උපදෙස් ලබා දෙන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,
   1. නතං කම්මං කතං සාධු යන්නයි.
   2. අත්තනාව කතං පාපං යන්නයි.
   3. සුකරානි අසාධූනි යන්නයි.
   4. තංච කම්මං කතං සාධු යන්නයි.

12. තිදොරින් සිදුවන අකුසල කර්ම වලින් "මනෝ කර්ම" වලට අයත් වන්නේ,
   1. පිසුනාවාච යි.
   2. අදත්තා දානය යි.
   3. ප්‍රාණඝාතය යි.
   4. මිත්‍යාදෘෂ්ටිය යි.

13. කර්මයේ බලපෑම කොතරම් තීරණාත්මක වුව ද ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සහයෙන් ක්‍රියා කිරීමෙන් ඇතැම් කර්ම විපාක මඟ හරවා ගත හැකිය. එය හඳුන්වන්නේ,
   1. කාල සම්පත්තිය නමිනි.
   2. ප්‍රයෝග සම්පත්තිය නමිනි.
   3. උපධි සම්පත්තිය නමිනි.
   4. ගති සම්පත්තිය නමිනි.

14. විපාක දීමට ඉදිරිපත් වන අනුපිළිවෙල අනුව සිව් ආකාර වන කර්ම අතුරෙන් බලවත් චේතනා ශක්තියකින් තොරව සිදු කරන කර්ම,
   1. ආසන්න කර්මය යි.
   2. කටත්තා කර්මය යි.
   3. ගරුක කර්මය යි.
   4. ආචිණ්ණ කර්මය යි.

15. "අනිච්චා වත සංඛාරා උප්පාද වය ධම්මිනෝ .........", යනාදී ගාථාව ඇසෙන විට අපට සිහිපත් වන්නේ,
   1. ත්‍රිලක්ෂණ ධර්මය යි.
   2. චතුරාර්ය සත්‍ය ධර්මය යි.
   3. පටිච්චසමුප්පාද ධර්මය යි.
   4. ත්‍රිශික්ෂා ධර්මය යි.

16. යම්කිසි පුද්ගලයෙකු හෝ වස්තුවක් පිළිබඳව හෝ යම් ක්‍රියාවක් ගැන හෝ අප්‍රිය ස්වභාවය විරුද්ධ ස්වභාවය හැඳින්වෙන්නේ,
   1. යසස නමින් ය.
   2. අභිද්‍යාව නමින් ය.
   3. ව්‍යාපාද නමින් ය.
   4. ක්ෂාන්තිය නමින් ය.

17. සියලු කෙලෙසුන් දුරු කිරීමේ නුවණ ලබා ගැනීමට විදර්ශනා භාවනාව වැඩිය යුතු වේ. එම නුවණ හැඳින්වෙන්නේ,
   1. දිබ්බ චක්ඛු ඤානය නමින් ය.
   2. පඤ්ච අභිඥා නමින් ය.
   3. පුබ්බේනිවාසානුස්සති ඤානය නමින් ය.
   4. ආසවක්ඛය ඤානය නමින් ය.

18. සියම් දේශයේ රජු විසින් උපාලි මහතෙරුන් ප්‍රධාන උපසම්පදාලාභී භික්ෂූන් පිරිසක් ලක්දිවට එවීමෙන් අනතුරුව මෙරට "සියම් මහා නිකාය" ආරම්භ විය. එකල ලක්දිව පාලකයා,
   1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය.
   2. විජයබාහු රජු ය.
   3. නිශ්ශංකමල්ල රජු ය.
   4. හතරවැනි පරාක්‍රමබාහු රජු ය.

19. දුටුගැමුණු මහ රජතුමා විසින් ඉදි කරන ලද විහාරාරාංග වලට අයත් නොවන්නේ,
   1. ලෝවාමහාපාය යි.
   2. රුවන්වැලි මහ සෑය යි.
   3. ථූපාරාමය යි.
   4. මිරිසවැටිය යි.

20. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවෙන් සමන්විත වේ. එහි සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන අංග අයත් වන්නේ,

www.edudept.up.gov.lk

1. සමාධියට යි.  2. අනාත්මයට යි.
3. ප්‍රඥාවට යි.  4. සීලයට යි.

21. සිඟාලෝවාද සූත්‍රගත යුතුකම් හා වගකීම් වලට අනුව ගරු කිරීමත්, අවමන් නොකිරීමත්,
1. දරුවන්ගේ යුතුකමකි.  2. ශිෂ්‍යාගේ යුතුකමකි.
3. ස්වාමි පුරුෂයාගේ යුතුකමකි.  4. සේවකයාගේ යුතුකමකි.

22. සිඟාල ගෘහපතියාට දේශනා කළ සදිසා නමස්කාරයේ "උවදුරුවලින් එතෙර කරනවාය" යන අර්ථය ඇතිව දැක්වූ සදිසාව වන්නේ,
1. දකුණු දිසාව යි.  2. උතුරු දිසාව යි.
3. නැගෙනහිර දිසාව යි.  4. උඩ දිසාව යි.

23. දීර්ඝ කාලයක් තිස්සේ විජාතිකයන්ට යටත්ව සිටීම නිසා යටපත් වී ගිය ජාතික ආගමික අභිමානය ගොඩ නැගුවේ අනගාරික ධර්මපාල තුමාය. එතුමා සිදු කළ මෙහෙයක් වන්නේ ,
1. බරණැස මූලගන්ධ කුටි විහාරය ඉදි කිරීම.  2. සරසවි සඳරැස පුවත්පත ආරම්භ කිරීම.
3. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම.  4. මහනුවර නියම කන්දේ පිරිවෙන ආරම්භ කිරීම.

24. බුදුරජාණන් වහන්සේ විසින් පුද්ගලයාගේ මෙලොව පරලොව හිත පිණිස හේතු වන කරුණු අතුලත්ව දීඝජානු කෝලිය පුත්‍රයාට දේශනා කළ සූත්‍රය වන්නේ,
1. පරාභව සූත්‍රය යි.  2. ධම්මික සූත්‍රය යි.
3. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.  4. මහා මංගල සූත්‍රය යි.

25. මිනිසුන් රාගයෙන් රාගයටම, ද්වේශයෙන් ද්වේශයටම, මෝහයෙන් මෝහයට ම යති. මේ පිළිවෙත,
1. අනුසෝතගාමී ය.  2. කාමසුඛල්ලිකානු යෝගය යි.
3. අත්තකිලමතානු යෝගය යි.  4. පටිසෝතගාමී ය.

26. අසත්පුරුෂයන් ප්‍රියවීම, අසත්පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම කෙනෙකු තුළ ඇත්නම් ඔහු තුළ ඇත්තේ,
1. මංගල කරුණු ය.  2. දියුණුවට හේතුවන කරුණු ය.
3. වසල කරුණු ය.  4. පරාභව කරුණු ය.

27. "සමගි වන්න විවාද නොකරන්න" යන අදහස ඇතුලත් උතුම් බුදු වදන වන්නේ,
1. සමග්ගා හෝථ මා විවදථ  2. සන්තුට්ඨී පරමං ධනං
3. සමග්ගා හෝන්ති බ්‍රාහ්මණෝ  4. සමවායෝ එව සාධු

28. කර්මය පිළිබඳ ඉගැන්වීම් අනුව ගරු කළ යුත්තාට ගරු කරන, පිදිය යුත්තන් පුදන මානයෙන් තොර වූ තැනැත්තා,
1. පොහොසත්ව උපදි යි.  2. වර්ණවත්ව උපදි යි.
3. මහේශාක්‍යව උපදි යි.  4. උසස් යැයි සම්මත කුලවල උපදි යි.

29. "කුසලාකුසල කර්ම රැස් කිරීම හේතු කොට ගෙන ප්‍රතිසන්ධි සිත පහළ වෙයි" යන්න ප්‍රකාශ වන්නේ,
1. අවිජ්ජා පච්චයා සංඛාර යන්නෙන්.  2. නාම රූප පච්චයා සළායතනං යන්නෙන්.
3. සංඛාර පච්චයා විඤ්ඤාණං යන්නෙන්  4. ඵස්ස පච්චයා වේදනා යන්නෙන්.

30. චක්කවත්ති සීහනාද සූත්‍රගත හේතුඵල න්‍යායට අනුව අදැහැමි සමාජයක් ඇති වීමට මූල හේතුව වන්නේ,
1. අවි ආයුධ භාවිතය යි.  2. දිළිඳුකම යි.
3. සොරකම යි.  4. ප්‍රාණඝාතය යි.

31. දුක සැප විඳදරා ගැනීමේ සමබර මානසිකත්වයක් ගොඩ නගා ගැනීමට හැකියාව ලැබෙන බෞද්ධ ඉගැන්වීම වන්නේ,
1. අටලෝ දහමින් කම්පා නොවීම යි.  2. අනිත්‍යතාව අවබෝධක කර ගැනීම යි.
3. කර්මය පිළිබඳ හැදෑරීම යි.  4. චතුරාර්ය සත්‍ය අවබෝධය යි.

32. සත්‍යාවබෝධය සඳහා බෝසතාණන් වහන්සේ තෝරාගත් උරුවෙලෙහි සේනානිගම පිළිබඳව බුද්ධත්වයෙන් පසු සිත්කලු ලෙස වර්ණනා කරන ලද සූත්‍රය වන්නේ,
1. සිංසපා සූත්‍රය.  2. සාමඤ්ඤඵල සූත්‍රය.

www.edudept.np.gov.lk

3. අරියපරියේසන සූත්‍රය. 4. ධනිය ගෝපාල සූත්‍රය

33. බුද්ධ දේශනාවට අනුව ලොව පවත්නා බලවත්ම රෝගය වන්නේ,
1. පිළිකාව යි. 2. කුසගින්න යි.
3. පිත්ත රෝගය යි. 4. අංශභාගය යි.

34. තෙවන ධර්ම සංගායනාවේ දී අභිධර්ම පිටකයට එක් වූයේ,
1. විභංගප්පකරණය යි. 2. පට්ඨානප්පකරණය යි.
3. ධාතුකථාප්පකරණය යි. 4. කථාවත්ථුප්පකරණය යි.

35. පාලකයෙකු "පුර පක්ෂයේ සඳමෙන්" දිනෙන් දින දියුණුව කරා ගෙන යන බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය වන්නේ,
1. සතර අගතියෙන් තොර වීම යි. 2. සතර බ්‍රහ්ම විහරණය යි.
3. සතර සංග්‍රහ වස්තුව යි. 4. සප්ත අපරිහානීය ධර්ම යි.

36. "සෝවාන් ආදි මාර්ග සිත්වල පහල වන සිව්සස් අවබෝධ කර ගන්නා දැක්ම" දහමේ හැඳින්වෙන්නේ,
1. ඵල සම්මා දිට්ඨිය නමින් ය. 2. මාර්ග සම්මා දිට්ඨිය නමින් ය.
3. ධ්‍යාන සම්මා දිට්ඨිය නමින් ය. 4. විදර්ශනා සම්මා දිට්ඨිය නමින් ය.

37. ධාර්මිකව උපයාගත් ධනයක් තමන්ට ඇතැයි සිතා යම් කෙනෙක් සතුට ලබයි නම් එම සතුට,
1. අණන සුඛය යි. 2. අනවජ්ජ සුඛය යි.
3. භෝග සුඛය යි. 4. අත්ථි සුඛය යි.

38. භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ඨතම මහා කාව්‍ය වන්නේ,
1. සසදාවත යි. 2. මුව දෙව්දාවත යි.
3. කව්සිළුමිණ යි. 4. කාව්‍යශේඛරය යි.

39. නූතන යුගය ආරම්භයේ බෞද්ධ චිත්‍ර නිරූපණයට යොමු වූ යුරෝපීය ස්වභාවික චිත්‍ර ශෛලියෙන් විහාර සිතුවම් කළ චිත්‍ර ශිල්පියෙකි.
1. එම්. සාර්ලිස් මහතා. 2. ඇල්බට් ධර්මසිරි මහතා.
3. සෝලියස් මෙන්දිස් මහතා. 4. සෝමබන්දු විද්‍යාපති මහතා.

40. මිහිඳු මහරහතන් වහන්සේගේ උපදෙස් මත බුදුරදුන්ගේ දකුණු අකු ධාතුන් තැන්පත් කර දෙවන පැතිස්ස රජු ඉදි කළ ස්තූපය,
1. මිරිසවැටි සෑය යි. 2. ථූපාරාමය යි.
3. කණ්ඨක චේතිය යි. 4. ගිරිහඬු සෑය යි.

(ලකුණු 40 x 1 = 40 යි)

www.edudept.up.gov.lk

www.edudept.up.gov.lk